# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1840/24 – 2013 දෙසැම්බර් 10 වැනි අඟහරුවාදා – 2013.12.10**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

2013 අංක 384 දරන ආඥාව

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/108.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
ඩීඑස්/කේජ්කේ/3/2/ඩබ්ලිව්/2011/26.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.–** ප්‍රාදේශීය ලේකම්, මහනුවර.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟවට කෝරළේ සුළු කොට්ඨාසයේ, අම්පිටිය උඩගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/එම්එච්එන්/2012/657 හා 2013.02.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0035 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි දෙකට (02) ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වැමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0030 ක් පමණ**

උතුරට: එස්. දාබරේ සහ සී. කේ. ඩී. විතානගේ හිමිකම් කියන වැමුල්ල වත්ත සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී සහ මු.පි.මහ 6041 හි කැබලි අංක 13 (ප්‍රාදේශීය සභා මාර්ගය); දකුණට: මු. පි. මහ 6041 හි කැබලි අංක 13 (ප්‍රාදේශීය සභා මාර්ගය); බටහිරට: එස්. දාබරේ හිමිකම් කියන වැමුල්ල වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – වැමුල්ලවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0005 ක් පමණ**

උතුරට: සී. කේ. ඩී. විතානගේ හිමිකම් කියන වැමුල්ල වත්ත; නැගෙනහිරට: මු.පි.මහ 6041 හි කැබලි අංක 13 (ප්‍රාදේශීය සභා මාර්ගය); දකුණට: මු. පි. මහ 6041 හි කැබලි අංක 13 (ප්‍රාදේශීය සභා මාර්ගය සහ කැබලි අක්ෂර ඒ); බටහිරට: කැබලි අක්ෂර ඒ, එස්. දාබරේ සහ සී. කේ. ඩී. විතානගේ හිමිකම් කියන වැමුල්ල වත්ත.

12 - 1061


1A – G 18705 – 240 (2013/12)



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 385 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/9/2012/ඩබ්එස්/365.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: සීඑච්අයි/එල්එන්ඩී.
අයි/ඒකියුයූඅයිඑස්/4/1/(2013).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හලාවත.

2. **ඉඩමේ විස්තරය.**– වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මුන්නේස්සරම පත්තුව සුළු කොට්ඨාසයේ, මුන්නේස්සරම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක පීයූ/සීඑච්එල්/2013/085 හා 2013.04.23 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0127 ක් පමණ වන ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම නමැති පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0127 ක් පමණ**

උතුරට: ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය හිමිකම් කියන ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම; නැගෙනහිරට: ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය හිමිකම් කියන ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම සහ ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය හිමිකම් කියන ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම; බටහිරට: ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථානය හිමිකම් කියන ශ්‍රී පුෂ්පාරාම විහාරස්ථාන ඉඩම නොහොත් මුන්නේස්සරම් පන්සල් ඉඩම.

12 - 1062

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 386 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/9/2012/ඩබ්එස්/227.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: උප/03/ඉ/අත්/පොදු/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 04 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, දොළුව - ගම්පොල.

2. **ඉඩමේ විස්තරය.**– මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර පහළ කෝරළේ සුළු කොට්ඨාසයේ මැදපිටිය (කසි 320026) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/ඩීඕඑල්/2012/683 හා 2013.02.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0128 ක් පමණ වන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කැබලි දෙක (02) ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – අඹගස්තැන්න නොහොත් ලියෝවත්ත නොහොත් ඕරුවකෙටුතැන්නේහේන – ප්‍රමාණය: හෙක්. 0.0115 ක් පමණ**

උතුරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත; නැගෙනහිරට:ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත සහ ඇළ; දකුණට: ඇළ සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – අඹගස්තැන්න නොහොත් ලියෝවත්ත නොහොත් ඕරුවකෙටුතැන්නේහේන – ප්‍රමාණය: හෙක්. 0.0013 ක් පමණ**

උතුරට: ඇළ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත; නැගෙනහිරට:ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන ලියෝවත්ත සහ ජී. ආර්. සීලවතී හිමිකම් කියන ඕරුවකෙටුතැන්නේහේන; දකුණට: ජී. ආර්. සීලවතී හිමිකම් කියන ඕරුවකෙටුතැන්නේහේන සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); බටහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඇළ.

12 - 1063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.